අක්ෂර හා සංඛ්‍යා හතකින් සමන්විත පාඨමාලා කේතයක් පහත සඳහන් පරිදි එකිනෙක පාඨමාලාවන්ට පවරා ඇත. (උදා- STP8301)

| | | |
|---|---|---|
| පළමු සහ දෙවන අක්ෂරය | - | අධ්‍යයන අංශය (වගුව 1) |
| තුන්වන අක්ෂරය | - | අධ්‍යයන වැඩසටහන (වගුව 2) |
| පළමුවන සංඛ්‍යාංකය | - | වැඩසටහන තුළ අධ්‍යයන මට්ටම |
| දෙවන සංඛ්‍යාංකය | - | ශාස්ත්‍රීය අංශය (වගුව 3) |
| අවසාන සංඛ්‍යාංක දෙක | - | පාඨමාලාවේ සුවිශේෂ අනුක්‍රමික අංකය |

**වගුව 1 අධ්‍යයන අංශය**

| පීඨය | අධ්‍යයන අංශය |
|---|---|
| අධ්‍යාපන | ද්විතියික හා තෘතියික අධ්‍යාපන |
| | මුල් ළමාවිය අධ්‍යාපන |
| | විශේෂ අවශ්‍යතා අධ්‍යාපන |
| ස්වාභාවික විද්‍යා | ශුද්ධ විද්‍යාව |
| | උද්භිද විද්‍යාව |
| | රසායන විද්‍යාව |
| | භෞතික විද්‍යාව |
| | සත්ත්ව විද්‍යාව |
| | ගණිතය |
| | හෙද සේවය |
| ඉංජිනේරු තාක්ෂණ | සිවිල් තාක්ෂණය |
| | සන්නිවේදන තාක්ෂණය |
| | පරිගණක විද්‍යාව |
| | විදුලි තාක්ෂණය |
| | ඉලෙක්ට්‍රොනික තාක්ෂණය |
| | ඉංජිනේරු විද්‍යාව |
| | යාන්ත්‍රික තාක්ෂණය |
| | පේෂකර්ම තාක්ෂණය |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | භාෂා අධ්‍යයන |
| | නීතිය |
| | කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය |
| | සමාජ අධ්‍යයන |
| සෞඛ්‍ය විද්‍යා | හෙද |
| | ඖෂධවේදී |
| | වෛද්‍ය රසායනාගාර |
| | මූලික විද්‍යා |
| | මනෝවිද්‍යාව |
| කළමනාකරණ අධ්‍යයන | සංවිධාන අධ්‍යයන |
| | ගිණුම්කරණය සහ මූල්‍ය |
| | මානව සම්පත් කළමනාකරණය |
| | අලෙවි කළමනාකරණය |

## දෙවන කොටස

### අධ්‍යාපන පීඨය

අධ්‍යාපන පීඨය අධ්‍යයනාංශ තුනකින් සමන්විතය.

1. ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය
2. ප්‍රාථමික හා මුල් ළමාවිය අධ්‍යයනාංශය
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය
4. අධ්‍යාපන නායකත්වය සහ කළමනාකරණ අධ්‍යයනාංශය

ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යයනාංශය මගින් ඉදිරිපත් කරන අධ්‍යයන වැඩසටහන් අටකි.

1. අධ්‍යාපන දර්ශනශූරී උපාධි වැඩසටහන
2. අධ්‍යාපන දර්ශනපති උපාධි වැඩසටහන
3. අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන
4. අධ්‍යාපනපති උපාධි වැඩසටහන
5. ගුරු අධ්‍යාපනපති උපාධි වැඩසටහන
6. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන
7. අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලාව) උපාධි වැඩසටහන
8. අධ්‍යාපනවේදී (ස්වාභාවික විද්‍යා) උපාධි වැඩසටහන
9. පර්යේෂණ පිළිබඳ කෙටිකාලීන සහතික පත්‍ර පාඨමාලාව

### 2.0 පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන

මෙය මාස 15 ක අධ්‍යයන වැඩසටහනකි.

### 2.1 පරමාර්ථ

මෙම වැඩසටහනෙහි මූලික පරමාර්ථය වන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිටින උපාධිධාරී ගුරුවරුන්ට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු උපාධිධාරී නිලධාරීන්ට වෘත්තීය පුහුණුවක් ලබා දීමයි.

### 2.2 ඇතුළත්වීම සඳහා සුදුසුකම්

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අවම වශයෙන් අවුරුදු **තුනක (03)** ප්‍රථම උපාධියක් හෝ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගත් ඊට සමාන සුදුසුකම් ලබා තිබීම සහ

2. පිළිගත් පාසලක සේවයේ නියුතු ගුරුවරයකු හෝ විදුහල්පතිවරයකු හෝ ගුරු උපදේශකවරයකු වීම හෝ ගුරු අධ්‍යාපනඥ සේවයේ හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු වීම හෝ විශ්වවිද්‍යාල, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, කාර්මික විද්‍යාල, ගුරු විද්‍යාල පූර්ණකාලීන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු වීම හෝ ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවකු වීම හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරයකු වීම සහ

**වෛකල්පික පාඨමාලා (2)**

| | | | |
|---|---|---|---|
| 10, 11 STP8209 | අධ්‍යාපන කළමනාකරණය | | |
| STP8210 | ළමා අයිතිවාසිකම් | } | මින් දෙකක් |
| STP8211 | ප්‍රාථමික අධ්‍යාපනය | | |
| STP8212 | බහුශ්‍රේණි ඉගැන්වීම | | |

අධ්‍යාපන තාක්ෂණයේ පදනම් පාඨමාලාව (STP8404) යටතේ හදාරනු ලබන විශේෂ ඉගැන්වීම් ක්‍රම සඳහා පහත සඳහන් විෂයයන් අතරින් එක් විෂයයක් හෝ දෙකක් තෝරා ගැනීමට ශිෂ්‍යයාට හැකි ය.

1. බෞද්ධ/ක්‍රිස්තියානි ඉස්ලාම් ධර්මය/හින්දු ආගම
2. සිංහල භාෂාව/දෙමළ භාෂාව
3. ඉංග්‍රිසි භාෂාව
4. ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය
5. විද්‍යාව
6. ගණිතය
7. වාණිජ්‍යය
8. ගෘහ ආර්ථික විද්‍යාව
9. ප්‍රාථමික පාසලේ සමෝධානිත විෂයන්
10. සෞන්දර්ය අධ්‍යාපනය
11. තොරතුරු තාක්ෂණය

ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ද විශේෂ ඉගැන්වීම් ක්‍රම සඳහා තෝරා ගන්නා ලද විෂයය/විෂයන් තෝරා ගැනීම වඩාත් සුදුසු වේ.

## 2.4 දින පාසල් හා ශිෂ්‍ය උපදේශන සැසි

දැනුම ලබා දීමේ ප්‍රධාන ක්‍රමය Moodle - LMS - Learn OUSL හි සංවර්ධනය කර ඇති මාර්ගගත පාඨමාලා වේ. මෙම මාර්ගගත පාඨමාලා වලට අමතරව ශ්‍රව්‍ය දෘශ්‍ය පට භාවිතයට ද කටයුතු සලසා ඇත. ප්‍රාදේශිය/අධ්‍යයන මධ්‍යස්ථානවල දී දින පාසල් දහනවයක් (19) ක් පවත්වනු ලැබේ. සාකච්ඡා, කාර්ය සැසි, ක්‍රියාකාරකම් පාදක ස්වරූපයෙන් පවත්වනු ලබන මෙම දින පාසල්වල දී මුද්‍රිත පාඩම් යාවත්කාලින කිරීමට හා සිසුන්ගේ අධ්‍යයන ගැටලු සාකච්ඡා කිරීමටත් අපේක්ෂා කෙරේ.

දින පාසල්වලට අමතරව කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කරනු ලබන උපදේශන සැසි සඳහා පැය 30 කට ආසන්න කාලයක් වෙන් කර ඇත. මෙම උපදේශන සැසිවල දී සිසුන්ගේ ඉගෙනීම් කටයුතු සම්බන්ධ ගැටලු, පැවරුම් සම්බන්ධ ගැටලු හා වෙනත් අදාළ ගැටලු සාකච්ඡා කිරීමටත්, ඔවුන් විභාග සඳහා යොමු කිරීමටත් අපේක්ෂිතය.

## 2.5 ඉගැන්වීමේ මාධ්‍යය

මෙම වැඩසටහන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

## 2.6 ප්‍රාදේශිය/අධ්‍යයන මධ්‍යස්ථාන

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන සඳහා දැනට පහත සඳහන් ප්‍රාදේශිය මධ්‍යස්ථාන හා අධ්‍යයන මධ්‍යස්ථාන යොදා ගෙන ඇත. **එහෙත් එක් එක් වර්ෂයේ දි එක් එක් මධ්‍යස්ථානය තෝරා ගන්නා සිසුන් සංඛ්‍යාව, මාධ්‍යය හා ඒ ඒ මධ්‍යස්ථානයට අනුබද්ධව කථිකාචාර්යවරුන් ලබා ගැනීමේ පහසුව මත ඒවා තවදුරටත් මධ්‍යස්ථාන ලෙස යොදා ගැනීම හෝ නොගැනීම තිරණය වනු ඇත.**

| | |
|---|---|
| කොළඹ | කුරුණෑගල |
| මාතර | කෑගල්ල |
| යාපනය | රත්නපුර |
| අනුරාධපුරය | බණ්ඩාරවෙල |
| මඩකලපුව | ගම්පහ |
| ගාල්ල | අම්පාර |
| අම්බලන්ගොඩ | ත්‍රිකුණාමලය |
| හැටන් | පුත්තලම |
| වව්නියාව | අම්බලන්තොට |
| මහනුවර | කළුතර |
| බදුල්ල | මුලතිව් |
| මන්නාරම | පොළොන්නරුව |
| නාත්තන්ඩිය | කිලිනොච්චිය |

- **සැලකිය යුතුයි** : **01) අයදුම්කරුවන් විසින් ඉල්ලුම් කරනු ලබන අධ්‍යයන වැඩසටහන සඳහා ලියාපදිංචි කරගනු ලබන අධ්‍යයන මධ්‍යස්ථානය සහ මාධ්‍යය කිසිසේත් වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.**

## 2.7 ඇගයුම

ඇගයුම කරනු ලබන්නේ පහත සඳහන් ක්‍රම මගිනි.

**(අ) නියම කරන ලද අනිවාර්ය ලිඛිත පැවරුම් මගින් සිදු කරන අඛණ්ඩ ඇගයුම්**

මේවා නියමිත දිනට සම්පූර්ණ කොට භාර දිය යුතුය. ශාස්ත්‍රිය අගය 3ක් හෝ 4ක් වන සෑම පාඨමාලාවක් සඳහාම අඛණ්ඩ තක්සේරුකරණ තුනක් අන්තර්ගත වේ. එවැනි පාඨමාලාවක අවසාන පරීක්ෂණය සඳහා යෝග්‍යතාව ලැබීමට නියමිත අඛණ්ඩ තක්සේරුකරණ 3 ම සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. ඒ අනුව සමස්ත අඛණ්ඩ තක්සේරුකරණ ලකුණ හෙවත් තක්සේරුකරණ 3 හි මුළු ලකුණුවල සාමාන්‍ය (OCAM) ලකුණු 40 ක් හෝ ඊට ඉහළ ලකුණක් වීම අත්‍යවශ්‍ය වේ.

### 2.7.1 සැලකිය යුතුයි

ගුරුවරුන් නොවන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුක්ත අයදුම්කරුවන් පහත සඳහන් ලිපි, ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූ පසු කැඳවන ලියාපදිංචිය සඳහා රැගෙන ආ යුතුය.

**අ.** ප්‍රායෝගික ඉගැන්වීම (STP8808) අදියර 1 නිම කිරීම සඳහා විදුහලක් (රජයේ හෝ රජයේ අනුමත) තමා විසින් ම තෝරා ගෙන විවෘත විශ්වවිද්‍යාලය විසින් නියම කරනු ලබන සති 10 ක කාල සීමාව තුළ තෝරාගත් එම විදුහලේ ඉගැන්වීම් කාර්යයේ නිරත වීමට අවසර දිය හැකි බවට විදුහල්පතිගෙන් ලබාගත් ලිපියක්

**ආ.** ප්‍රායෝගික ඉගැන්වීම (STP8808) අදියර 1 සඳහා විවෘත විශ්වවිද්‍යාලය විසින් නියම කරනු ලබන සති 10 ක කාල සීමාව තුළ අයදුම්කරුට නිවාඩු ලබා දිය හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් ලිපියක්

**ඇ.** මෙම අයදුම්කරුවන් අදාළ සති 10 තුළ තෝරාගත් පාසලේ පූර්ණ කාලීනව ඉගැන්වීම් කටයුතුවල නිරත විය යුතු ය.

**ඈ.** ඉහත කොන්දේසි අනුව කටයුතු කිරීම අපහසු වන වෘත්තිය ගුරුවරුන් නොවන අයදුම්කරුවන්ට මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමෙන් වැළකී සිටින ලෙසට උපදෙස් දෙනු ලැබේ.

**ඉ.** තෝරා ගැනීමෙන් පසුව අවශ්‍ය වන ලියකියවිලි පිළිබඳව වැඩිදුරටත් දැනුවත් කරනු ලැබේ.

### 2.8 සහතික ප්‍රදානය

විවෘත විශ්වවිද්‍යාලයේ විධිවිධානවලට අනුකූලව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ.

### 2.9 ගාස්තු

| | | |
|---|---|---|
| ලියාපදිංචි කිරීමේ ගාස්තු | රු. | 1500.00 |
| පහසුකම් ගාස්තු | රු. | 2500.00 |
| පුස්තකාල පහසුකම් ගාස්තු | රු. | 200.00 |
| ශිෂ්‍ය උපදේශන ගාස්තු Credit එකක් සඳහා (මුළු Credit ගණන 36) | රු. | 2,150.00 |
| ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා | රු. | 7000.00 |

